(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **44.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 මාර්තු 19 බදාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **මංජුල සුරවීර ආරච්චි මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු අතුල වෙළඳගොඩ මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"තාරුණ්‍යය සඳහා වන පාර්ලිමේන්තු සංසදය දසවැනි පාර්ලිමේන්තුව සඳහා ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාවට 2025 මාර්තු 15 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී අනුමතිය හිමි වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

II

"ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් මෙම සභාව තුළදී හා ඉන් පිටත දී විශේෂයෙන්ම සමාජ මාධ්‍ය භාවිතා කරමින් පුද්ගලයින්, පුද්ගල කණ්ඩායම් හා විවිධ සංවිධානවලට එරෙහිව ඉතා පහත් පෙලේ වචන භාවිතා කරමින් සිදුකරනු ලැබ ඇති හා සිදුකරමින් පවතින විවිධ මතභේදාත්මක සහ අවමන් සහගත ප්‍රකාශ හේතුවෙන් පෞද්ගලිකව විවිධ පුද්ගලයින්ට සහ විවිධ සමාජ හා ජන කණ්ඩායම්වලට ඇති වී තිබෙන අසහනකාරී තත්ත්වයන් පිළිබඳ මා වෙත විවිධාකාරයෙන් කරන ලද පැමිණිලි කිරීම් පිළිබඳ මෙම සභාවට පැහැදිලි කිරීමක් කිරීමට කැමැත්තෙමි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීවරයා විසින් පෞද්ගලිකව කාන්තාවන් ඇතුළුව විවිධ පුද්ගලයින්, විවිධ සමාජ කණ්ඩායම් සහ ආගමික කණ්ඩායම් ඉලක්ක කරමින් එල්ල කරන ලද විවිධ අවමන් සහගත අශෝභන හා දැඩි මතභේදාත්මක ප්‍රකාශ සම්බන්ධව විවිධ පුද්ගලයින්, විවිධ සමාජ සංවිධාන, එසේම මෙම උත්තරීතර සභාව නියෝජනය කරන ආණ්ඩුව හා විරුද්ධ පාර්ශ්වයේ මහජන නියෝජිතයින් ඇතුළු විවිධ පාර්ශ්වයන් මා වෙත පෞද්ගලිකව පැමිණිලි කොට එකී ප්‍රකාශ සම්බන්ධයෙන් ඔවුන්ගේ දැඩි අප්‍රසාදය, කනස්සල්ල හා කණගාටුව පළ කර තිබෙන අතර, එවැනි ක්‍රියා සම්බන්ධව මෙම උත්තරීතර සභාවේ ප්‍රධානියා වශයෙන් නිසි පියවර ගන්නා ලෙස මා වෙත මේ වනවිටත් ඉල්ලීම් රාශියක් ඉදිරිපත් කර ඇති බව මෙම සභාවේ දැනගැනීම පිණිස සඳහන් කරනු කැමැත්තෙමි.

විශේෂයෙන්ම මෙම උත්තරීතර සභාව නියෝජනය කරන මහජන නියෝජිතයෙකු ලෙස හිමිව තිබෙන වරප්‍රසාද භාවිතා කරමින්, මෙම සභාවට පැමිණ පිළිතුරු ලබාදිය නොහැකි පිරිස් සම්බන්ධව මෙන්ම මෙම සභාව නියෝජනය කරනු ලබන වෙනත් මහජන නියෝජිතයන් සම්බන්ධයෙන් මෙන්ම වෙනත් විවිධ බාහිර සමාජීය හා ආගමික සංවිධාන ඇතුළු විවිධ ජන කණ්ඩායම් හා ජන කොට්ඨාස ඉලක්ක කර ඉතාමත් පහත් මට්ටමේ වචන භාවිත කරමින් ඔවුන්ගේ පෞද්ගලික ජීවිතවලට අතිශයින් බලපානු ලබන මෙවැනි අවමන් සහගත ප්‍රකාශ සම්බන්ධව කථානායකවරයා වශයෙන් මාගේ බලවත් අප්‍රසාදය පළ කරමි.

මෙම උත්තරීතර සභාව නියෝජනය කරනු ලබන මහජන නියෝජිතයෙකු ලෙස කරනු ලබන මෙම අවමන් සහගත සහ අශෝභන ප්‍රකාශ මඟින් ආයතනයේ උත්තරීතරභාවයට බලවත් කැළලක් හා අවමානයක් සිදුවන බවත් මම අවධාරණය කිරීමට කැමැත්තෙමි. තවද, ඒ තුළින් ජාතික සමඟියට හා සංහිඳියාවට බලවත් හානියක් සිදුවන බවත් සඳහන් කිරීමට කැමැත්තෙමි.

මෙවැනි ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙස අවස්ථා කිහිපයකදීම අදාළ මන්ත්‍රීවරයාට මා විසින් විවිධාකාරයෙන් අවවාද කර ඇතත්, එකී උපදෙස් පිළිගෙන කටයුතු කරන ආකාරයක් පෙන්නුම් කිරීමට අදාළ මන්ත්‍රීවරයා විසින් මුළුමනින්ම අපොහොසත් වී ඇති බවත් මම නිරීක්ෂණය කරමි.

මන්ත්‍රීවරයා විසින් සිදුකරනු ලබන මෙම ක්‍රියා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානයන්, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ විධිවිධානයන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ චර්යාධර්ම සංග්‍රහයේ ඇතුළත් විධිවිධානවලට මෙන්ම, චිරාත් කාලයක සිට පැවත එන පැරණි පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට මුළුමනින්ම පටහැනි හා අනනුකූල බව මෙහිලා විශේෂයෙන් අවධාරණය කරමි.

දිගින් දිගටම ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීවරයා විසින් සිදුකරනු ලබන මෙම ප්‍රකාශ පිළිබඳව ඉතා ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් හා සලකා බැලීමෙන් අනතුරුව ඒ තුළින් ජාතික සමඟියට හා සංහිඳියාවට එල්ලවන තර්ජන ද සැලකිල්ලට ගෙන කථානායකවරයා ලෙස මා වෙත ස්ථාවර නියෝගවල විධිවිධාන ප්‍රකාරව පැවරී ඇති බලතලවලට අනුකූලව 2025 මාර්තු 20 සහ 21, 2025 අප්‍රේල් 08, 09 සහ 10 හා 2025 මැයි 06, 07 සහ 08 යන පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දින අට (08) තුළදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් පාර්ලිමේන්තුව තුළදී සිදුකරනු ලබන කිසිදු ප්‍රකාශයක් ශ්‍රව්‍ය, දෘශ්‍ය හා සමාජ මාධ්‍යවල සජීවී විකාශය කිරීම අත්හිටුවීමට කටයුතු කරන ලෙස මම නියෝග කරමි.

තවද, අවස්ථානුකූලව මන්ත්‍රීවරයා විසින් සිදුකරනු ලබන එවැනි අවමන් සහගත, අශෝභන සහ පහත් පෙළේ වචන යොදා ගනිමින් කරනු ලබන ප්‍රකාශ සියල්ල හැන්සාඩ් වාර්තා වලින් ඉවත් කිරීමට පියවර ගනු ලබන බවත් වැඩිදුරටත් මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

තවද, මෙලෙස සජීවී විකාශය අත්හිටුවීමට කටයුතු කරන කාලය තුළදී මන්ත්‍රීවරයා විසින් පවත්වනු ලබන කථාවල අන්තර්ගතය සහ සිදුකරනු ලබන ප්‍රකාශ පිළිබඳව සැලකිල්ලට ගෙන මෙම තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීම පිළිබඳව සලකා බලනු ලබන බවත් වැඩිදුරටත් සඳහන් කිරීමට කැමැත්තෙමි.''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2023 වර්ෂය සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) කෝට්ටේ, මිරිහාන, රජ මහා විහාර පාර, අංක 137/3 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඒ. සමන්ප්‍රිය රුද්‍රිගු මහතාගෙන් ලැබුණු 2025.02.10 දිනැති පෙත්සම; සහ

(ii) කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවත, අංක 72 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්. ඒ. අයි. විමර්ශනී මිහිරාණි ද සිල්වා මහත්මියගෙන් ලැබුණු 2025.01.07 දිනැති පෙත්සම

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) ගල්ගමුව, තඹුත්ත, මයිලෑව, අංක 91 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එම්. විජේසිංහ මහතාගෙන් ලැබුණු 2024.12.10 දිනැති පෙත්සම ගරු චන්දන තෙන්නකෝන් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) ගම්පහ, යක්කල පාර, ද සේරම් පෙදෙස, අංක 72/4/ඩී දරන ස්ථානයෙහි පදිංචි යූ. ජී. පී. එම්. උඩලමත්ත මහතාගෙන් ලැබුණු 2025.01.23 දිනැති පෙත්සම ගරු රුවන් මාපලගම මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂයභාර අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසි නව දෙනෙකුගෙන් (29) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, නියෝජ්‍ය කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සංශෝධන සහිතව සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 116 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් (10) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ගෘහ්‍ය කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 117 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ගෘහ්‍ය කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහ අට දෙනෙකුගෙන් (18) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් තිස් එක් දෙනෙකුගෙන් (31) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහ අට දෙනෙකුගෙන් (18) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් විසි තුන් දෙනෙකුගෙන් (23) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් විසි නව දෙනෙකුගෙන් (29) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**15. උසස් නිලතල පිළිබඳ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් දහනව දෙනෙකුගෙන් (19) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**16. පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 129 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 15 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන ආණ්ඩු පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සහ විරුද්ධ පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**17. විසර්ජන පනත් කෙටුම්පත — (විසිහතරවැනි වෙන් කළ දිනය):** කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

ශීර්ෂය 116

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ගරු මුජිබුර් රහුමාන් මහතා ඉදිරිපත් කළ යෝජනාව,— "වැඩසටහන රුපියල් 10/- කින් අඩු කළ යුතු ය".

(පූ.භා. 11.09 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.54 ට ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.38 ට ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ශීර්ෂය 116 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 471,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 116 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 33,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 116 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 747,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 116 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 102,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 295

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 295 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 301,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 295 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 30,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 297

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 297 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 105,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 298

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 298 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 232,800,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 299

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 299 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 84,200,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 300

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 300 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 112,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 300 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 205,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 16 වැනි පිටුවේ 15 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"මූලධන 497,000,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 301

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 17 වැනි පිටුවේ 8 වැනි පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"වැඩසටහන 01 මෙහෙයුම් වැඩසටහන 88,000,000 126,100,000"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 302

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 302 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 26,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 302 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 900,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අනතුරුව සභාපති ප්‍රගතිය වාර්තා කළ යුතු යැයි ද, නැවත රැස්වීමට අවසර ගත යුතු යැයි ද රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 මාර්තු 20 බ්‍රහස්පතින්දා.

**18. කල් තැබීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2022 මඟින් රාජ්‍ය සේවයට ඇතිවන බලපෑම):** මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 21 සභා සම්මතිය අනුව, 2025 මාර්තු 20 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.